# වැඩිහිටියන් විදිහට අපි අපේ යුතුකම් වගකීම් නිවැරදිව ඉටුකළා නම් මේ වගේ වෙන්න බෑ

*ප්‍රවීණ මාධ්‍යවේදී*
*එඩ්මන්ඩ් රණසිංහ*



*එඩ්මන්ඩ් වික්‍රමරත්න රණසිංහ 1930 අගෝස්තු 14 දින මෙලොව එළිය දකින්නේ අවිස්සාවේල්ලේදීය. පුවක්පිටිය සිංහල ප්‍රාථමික පාසලෙන් ප්‍රාථමික අධ්‍යාපනයට අත්පොත් තැබූ ඔහු පසුව රත්නපුර පර්ගසන් බාලිකා විද්‍යාලය සහ සෙන් මේරීස් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබ පාසල් අධ්‍යාපනය අවසන් කළේය. පාසල් දිවියෙන් සමුගත් වහාම ලේකහවුස් ආයතනයේ මාධ්‍යවේදී රැකියාවක් ලබාගත් අතර එහිදී දක්වන ලද දස්කම් මත කෙටි කලකින්ම පුවත්පත් කතු තනතුර දක්වා උසස්වීම් ලබන්නට ඔහුට හැකිවිය. ලේක්හවුස් ආයතනයේ දීර්ඝ කාලයක් සේවය කිරීමෙන් අනතුරුව උපාලි විජේවර්ධන මහතා ඇරඹූ දිවයින පුවත්පත් ආයතනයේ පුරෝගාමී කතුවරයා ලෙස වැඩ බාරගනිමින් හෙතෙම මාධ්‍ය ජීවිතයේ නව නව පරිච්ඡේදයක් ඇරඹුවේය. පසුව උපාලි පුවත්පත් සමාගමේ කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂවරයා ලෙසින්ද පත්වූ එඩ්මන් රණසිංහ මහතා මේ වන විට පත්තර ලෝකයේ ක්‍රියාකාරී දිවියට ආයුබෝවන් කියා ජීවිතයේ සැදෑ සමය ගෙවමින් සිටියි. මෙවර කර්තෘ සංසදයේ සම්මාන උළෙලේදී විශේෂ සම්මාන ප්‍රධානයකින් ඇගයීමට ද ප්‍රාප්ත වූ එඩ්මන් රණසිංහ මහතා 'සන්නස' සමග සහෘද සංවාදයකට එක් වූයේ මේ අයුරිනි.*

**දීර්ඝ කාලයක් ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ බලවත් භූමිකාවකට හිමිකම් කී ඔබ දැන් ජීවිතයේ සැදෑ සමය ගතකරන්නේ කොයි විදිහටද?**
මේ දවස්වල නම් විශේෂයෙන් කිසිම කටයුත්තක යෙදිලා නෑ. ටික කාලයක් දුවගේ ගෙදර ඉඳලා ඊයේ පෙරේදා තමයි ආපහු ගෙදර ආවේ. තවම මෙතන මගේ ජීවන රටාව ගොඩනැගුණේ නෑ. මොන වගේ දෙයක්ද ඉදිරියේදී කරන්නේ කියන කාරණය ගැන තමයි දැන් කල්පනා කරන්නේ. යමක් කළ යුතුයි කියන හැඟීමක් තියනවා. මොකද තවමත් මට වැඩ කරන්න පුළුවන්. වත්ත පිටියේ කැත්ත උදැල්ලේ වැඩක් වුණත් කරන්න පුළුවන්.

**ඉදිරියේදී මොන වගේ දෙයක්ද කරන්න අදහස් කරන්නේ?**
යම් ක්‍රියාකාරී වැඩ පිළිවෙළකට යන්න ඕනේ. දැන් රටේ සිද්ධ වෙන දේවල් දිහා බලන කොට මට හිතෙනවා වැඩිහිටියන් වශයෙන් අපි කවුරුත් සමාජය වෙනුවෙන් කළ යුතු කාර්ය නිසි ලෙස ඉටු කරලා නැහැ කියලා. අද මිනිස්සුන්ට පාරට බැහැලා උද්ඝෝෂණ නොකර මොනම ප්‍රශ්ණයක්වත් විසඳගන්න බැරි තත්ත්වයකට රට පත්වෙලා. තමන්ට අසාදාරණ ස්ථාන මාරුවක් දුන්නා කියලා රාජකීය විද්‍යාලයේ ගුරුවරියක් වහළයට නැග්ගාම ඒකෙන් ගුරු වෘත්තියට වෙච්ච අවමානය ගැන කතාකරනවා. ඒකට හේතුව ගැන කතාකරන්නේ නෑ. හැම තැනකින්ම අහන්න ලැබෙන්නේ මේ වගේ දේවල්. වැඩිහිටියන් විදිහට අපි අපේ යුතුකම් වගකීම් නිවැරදිව ඉටුකළා නම් මේ වගේ වෙන්න බෑ කියල මට හිතෙනවා.

**රටේ පවතින මේ ගැටළු සහගත තත්ත්වයට ඔබ මැදිහත්වීමක් කරන්න බලාපොරොත්තුවෙන්නේ මාධ්‍ය මගින්ද? දේශපාලන වශයෙන්ද?**
ඇතිවෙලා තියන ප්‍රශ්ණ දේශපාලකයන් නිසාම ඇතිවුණ ප්‍රශ්න නෙවෙයි. සමාජයක් වශයෙන් ඉදිරි ගමනට බලපාන ප්‍රශ්ණයි. ඒ වෙනුවෙන් ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ මට තියන අවකාශය යොදාගනිමින් යම් දෙයක් කරන්න බලාපොරොත්තු වෙනවා. නමුත් මාධ්‍ය තුළින් කළ හැකිවන්නේ යමක් කියන එක විතරයි. එය කරන්න බැහැ. දැන් පත්තර බැලුවොත් ඒවා මත වලින් පිරිලා. නමුත් පත්තරවල ලියවෙනවා මිස ඒ කිසිවක් ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒ නිසා එතනින් ඔබ්බට යන්න, යම් ක්‍රියාකාරී දෙයක් කළ හැකි නම් එතනට යන්න මම කැමතියි. ඒ දේ කරන්නේ කොහොමද කියන එක ගැන මේ වෙනකොටත් යම් යම් අය සමඟ සාකච්ඡා කරමින් සිටිනවා. මම හැමදාම හිටියේ පාලක පක්ෂය දිහා විවේචනාත්මකව බලන, හරිවැරැද්ද කතාකරන, විකල්ප ඉදිරිපත් කරන තැනක. අදටත් ඒවගේ හිතන යම් පිරිසක් ඉන්නවා. ඒ අය සමඟ එකතුවෙලා ඉදිරියේදී යම් තීරණයක් ගන්නට හැකිවෙයි.

**ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ දීර්ඝ කාලයක් තිස්සේ ඔබ කළ සුවිශේෂී මෙහෙවර අගය කරමින් පසුගියදා කර්තෘ සංසද සම්මාන උළෙලේදී ඔබට විශේෂ සම්මානයක් පිරිනැමුවා. මේ සම්මානය ලැබීම ගැන මොකද හිතෙන්නේ?**
මම සම්මාන කියන දේවල් ගැන ඒ තරම් තැකීමක් කරන්නේ නැහැ. මීට කලිනුත් මට සම්මාන කීපයක් ලැබුණා. මම මට පැවරුණ දේ කුමක් හෝ වේවා ඒක උපරිමව කළා. එච්චරයි. යම් කෙනෙක් හිතනවා නම් එතනදි මම සම්මානයක් දිය යුතු මට්ටමේ සේවයක් කරලා තියනවා කියලා සම්මානයක් දීමේ වරදක් නැහැ. එතනදි යම් සතුටක් ලැබෙනවා. හැබැයි මොන සම්මානයක් වුණත් ඒකට නියම වටිනාකමක් ලැබෙන්නේ ඒ සම්මානය ලැබීම නිසා තවත් යමක් කරන්නට සම්මානලාභියාට මගපෑදීමක් වෙනවානම් තමයි. නැත්නම් ඉතිං සම්මානයක් ලැබුණා. එච්චර තමයි.

ඔබ ජනමාධ්‍යය ක්ෂේත්‍රයට පිවිසුණේ කොහොමද? ඒක එක්තරා විදිහකට අහම්බයෙන් සිදුවුණ දෙයක්. උසස් පෙළින් පස්සේ මට ඉංග්‍රීසි ගුරුපත්වීමක් ලැබුණා. ටික කාලයක් කරගෙන යනකොට ඒක මට එපා වුණා. ඒක මහ විශාල වගකීමක් විදිහටයි මට දැනුනේ. ඒ නිසා මම රස්සාවෙන් අයින් වුණා. ඔය දවස්වල දැන්වීමක් දාලා තිබුණා ලේක්හවුස් එකට මාධ්‍යවේදීන් ගන්නවා කියලා. මමත් ඇප්ලිකේෂන් එකක් දැම්මා. ඉන්ටවිව් එකක් තිබ්බා. එස්මන්ඩ් වික්‍රසිංහ මහත්තයා කළේ. ඒ කාලේ හිටිය බොහොම බුද්ධිමත් අයගෙන් කෙනෙක් ඒ මහත්තයා. ඒකෙන් මාව තොරාගත්තා. එතකොට මගේ වයස අවුරුදු විසි එකයි.

**ලේක්හවුස් මාධ්‍ය ජීවිතය කොහොමද?**
මුලින්ම මට පැවරුණේ 52 මැතිවරණය වාර්තා කරන එක. ඊට පස්සේ ඩේලි නිව්ස් එකේ පාර්ලිමේන්තු වාර්තා කළා. ඊළඟට දිනමිණට ගියා. එතනින් ජනතා පත්තරේට ඇවිත් ප්‍රාදේශීය ප්‍රවෘත්ති කර්තෘ වුණා. ඊළඟට ජනතාවෙම ප්‍රවාත්ති කර්තෘ වුණා. 65දි මම දිනමිණ ප්‍රවෘත්ති කර්තෘ වුණා. ඊළඟට දිනමිණ නියෝජ්‍ය කර්තෘ වුණා. ඒ කාලේ තමයි දිනමිණ අලෙවිය ලක්ෂය පැන්නුවේ. ඒ කාලේ ලේක්හවුස් එකේ කාර්යාලයක් ලන්ඩන්වල තිබුණා. මාස හයක් විතර මට එහෙ වැඩකරන්නත් ලැබුණා.

**ලේක්හවුස් එක ආණ්ඩුවට පවරා ගැනීමෙන් පස්සේ මොනවගේ වෙනස්කම්ද විශේෂයෙන් සිදුවුණේ?**
හැත්තෑවේ ඡන්ද කාලේ ඉඳලාම ලේක්හවුස් එක ආණ්ඩුවට ගන්නවා ගන්නවා කියන කතාව ගියා. ඡන්දයෙන් යූඑන්පිය පරාජය වෙලා හත් හවුල් ආණ්ඩුව ආවනේ බොහොම බලවත් විදිහට. ඇවිල්ලා අවුරුදු දෙකකට පස්සේ පවරාගැනීම සිදුවුණා. ඒ එක්කම මමත් ලේක්හවුස් එකෙන් ඉවත් වුණා.

*<u>අද මිනිස්සුන්ට පාරට බැහැලා උද්ඝෝෂණ නොකර මොනම ප්‍රශ්ණයක්වත් විසඳගන්න බැරි තත්ත්වයකට රට පත්වෙලා. තමන්ට අසාදාරණ ස්ථාන මාරුවක් දුන්නා කියලා රාජකීය විද්‍යාලයේ ගුරුවරියක් වහළයට නැග්ගාම ඒකෙන් ගුරු වෘත්තියට වෙච්ච අවමානය ගැන කතාකරනවා. ඒකට හේතුව ගැන කතාකරන්නේ නෑ.</u>*

**පවරාගැනීමෙන් පස්සේ ඔබට තවදුරටත් වැඩකරගෙන යන්න බැරි තත්ත්වයක් ඇතිවුණාද ?**
නෑ. වික්‍රමසිංහ මහත්තයා ගියානේ. ඒ එක්කම මමත් අයින් වුණා. පවරාගැනීම දේශපාලන තීරණයක්නේ. මට හිතුණා පවරාගැනීමෙන් පස්සේ ස්වාධීනව කටයුතු කරන්න ඉඩක් ලැබෙන එකක් නෑ කියලා. මොකද මේ අය හිතන්නේ මම හිටපු පාලකයන්ගේ මිනිහෙක් කියලානේ. ඉතිං මම ගියා. පවරාගත්තට පස්සේ බෝධිනායක මහත්තයා සභාපති වුණා. මාත් එක්ක දිනමිණේ හිටිය දයාසේන ගුණසිංහ. ප්‍රභාත් මානවසිංහ එහෙම බෝධිනායක මහත්තයාට කියලා තියනවා දිගටම වැඩකරගෙන යන්න නම් මාව ගන්න ඕනේ කියලා. පස්සේ බෝධිනායක මහත්තයා මට ලිපියක් එවලා තිබුණා දිනමිණ කර්තෘ හැටියට වැඩ බාර ගන්න කියලා. ඊට පස්සේ ආපහු ලේක්හවුස් ගියා.

**දේශපාලන බලපෑම් තිබුණේම නැත්ද?**
ක්‍රමයෙන් ආවා. දිනමිණේ ටික කාලයක් ඉන්නකොට මාව සිළුමිණ කර්තෘ කළා. මම ටී.බී. ඉලංගරත්න මහත්තයාගේ නවකතාවක් සිළුමිණේ කොටස් වශයෙන් පළකරන්න පටන් ගත්තා. එක කොටසයි පළවුණේ. බෝධිනායක මහත්තයා කතාකරලා කිව්වා මේක පළකරන එක නවත්තන්න කියලා. මම කිව්වා ඒක කරන්න බෑ. දැන් අපි පාඨකයාට මේක හඳුන්වලා දීලා තියනවා. ඒ නිසා කතාව පළවෙන්න ඕනේ කියලා. ඕනේ නම් කතාව තියන විදිහ වෙනස් කරලා ටිකක් කොට කරමු කියලා. ඉලංගරත්න මහත්තයාට මම කිව්වා මෙහෙම ජරමරයක් තියනවා කියලා. පස්සේ කතාව කොට කරලා පළ කළා.

සංවාදය හා ඡායාරූප
**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

**ඔබ ''දිවයින''ට සම්බන්ධ වුණේ කොහොමද?**
ඔය විදිහට ටික කාලයක් යනකොට මට ලේක්හවුස්එක එපා වුණා. එහෙම ඉන්නකොට තමයි විජේවර්ධන මහත්තයා පත්තරයක් ගහන්න ඕනේ කියලා මට කතා කළේ. මම ගියා. ලේක්හවුස් එකේ හිටිය සෑහෙන දෙනෙක් ගියා. මට ඉරිදා දිවයින බාර දුන්නා. මගේ පිළිවෙළ වුණේ වැඩ බදාගන්න එක නෙවෙයි. සුදුස්සන්ට වැඩ පවරණ එක. අලුත් දේවල් කරන්න ඉඩ දෙන එක. වෙන වෙන දේවල් ගැන මම අවධානය යොමුකළේ නෑ. දක්ෂකමක් දැක්කද එයාට වගකීම් දුන්නා.

**ඔබ කර්තෘවරයෙක් විදිහට සාර්ථක වෙන්න බලපෑ හේතු මොනවද?**
මට සිංහල ලියන්න නම් වැඩිය බෑ. නමුත් මට තියනවා හොඳ සෙන්ස් එකක්. මොනවගේ දෙයක් මොන විදිහට ලිව්වොත් පාඨකයා කැමති වෙයිද කියන හැඟීමක් මට තියනවා. ඒ වගේම මම හුඟාක් ඉංග්‍රීසි පොත් පත් කියවනවා. ඒවයින් අලුත් තොරතුරු දැනගන්න ලැබෙනවා. ඒවා අපිට සුදුසු ආකාරයට ගලපා ගන්නත් මට හැකියාව තියනවා. මම හිතන්නේ ඒ දේවල් තමයි හේතු වෙන්න ඇත්තේ.

**ලේක්හවුස් එකේ නොතිබුණු නිදහසක් දිවයිනේදී ඔබට ලැබුණාද?**
ඒගොල්ලොත් එක්කත් මම කොයිතරම් හැප්පුණාද? වැඩ බාර අරගෙන මාසයක් ගියේ නෑ මම පත්තරේට තෝරගෙන තිබුණු ලිපියක්